රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරට කුසලතා පදනම මත බඳවා ගැනීම -2025

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරු 69 ක් කුසලතා පදනම මත සම්පූර්ණ කිරීම සඳහා පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද සක්‍රීය සේවයේ නියුතු බලයලත් නිලධාරීන් වෙතින් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. සුදුසුකම්:
   I. බලයලත් නිලධාරී I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
   II. බලයලත් නිලධාරී II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබීම.
   III. කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 236 වගන්තිය අනුව සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. උසස් කිරීමේ ක්‍රමය:
   ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/04-03/01/2025 හා 2026.06.12 දිනැති ලිපිය මඟින් නිකුත් කරන ලද එම කොමිෂන් සභාවේ නියෝගය ප්‍රකාරව මෙම අවස්ථාවට පමණක්වන සේ අනුමත බඳවා ගැනීම පටිපාටියෙන් පරිබාහිරව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීම මඟින් මෙම තනතුරු පුරප්පාඩුව පුරවනු ලැබේ.

4. ලකුණු ලබා දීමේ පටිපාටිය

| අනු අංකය | ලකුණු ලබා දීමේ ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| 01 | **අතිරේක සේවා පළපුරුද්ද සඳහා**<br>(සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලයට අමතරව වන සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලබන අතර එම අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දීමේදී වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට වෙන්කර ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස ද අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ)<br><br>➢ අනෙකුත් නිලධාරීන් සඳහා අමතර සේවා කාලය =<br><br>අමතර සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / සේවා පළපුරුද්ද වැඩිම නිලධාරියාගේ අමතර සේවා කාලය (අවුරුදු x 12+මාස) X අදාළ නිලධාරියාගේ අමතර සේවා කාලය (අවුරුදු x 12+මාස) | 50 | අදාළ නොවේ |
| 02 | **නිපුණතාව**<br><br>සම්මුඛ පරීක්ෂණයේදී පහත ආවරණය කරනු ලබනු විෂය ක්ෂේත්‍ර යටතේ මේ සමඟ යොමු කරනු ලබන ඇමුණුම 01 ප්‍රකාරව ලකුණු පිරිනමනු ලැබේ.<br><br>I. ජාත්‍යන්තර ගුවන් ගමන් රෙගුලාසි සහ ජාත්‍යන්තර ගුවන් සේවා ප්‍රමිතීන් පිළිබඳ පුළුල් අවබෝධයක් | 50 | 25 |

| | | | |
|---|---|---|---|
| | පෙන්නුම් කරන අතර, ඒ සම්බන්ධ තාර්කිකත්වය පැහැදිලිව විස්තර කිරීමට ඇති හැකියාව.<br>II. ගුවන් ගමන් සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම්වල විධිවිධාන පිළිබඳ පුළුල් අවබෝධය.<br>III. ආගමන හා විගමන පනතේ සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන සහ ඒවා යටතේ සාදන ලද රෙගුලාසි පිළිබඳ පුළුල් අවබෝධය හා මෙම රෙගුලාසිවල තාර්කිකත්වය පැහැදිලිව විස්තර කිරීමට ඇති හැකියාව.<br>IV. රටට ඇතුළුවීමට අපේක්ෂා කරන පුද්ගලයින්ගේ අනන්‍යතාවය, ලේඛන සහ අභිප්‍රාය සත්‍යාපනය කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිවල ප්‍රධාන පියවරවල පවතින තාර්කිකත්වය පැහැදිලිව විස්තර කිරීමට ඇති හැකියාව.<br>V. අසාමාන්‍ය හැසිරීම් නිරීක්ෂණය කිරීමට සහ හඳුනා ගැනීමට සහ ඉක්මනින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව.<br>VI. ජනතාවට නීත්‍යානුකූලව ගමන් කිරීම පහසු කිරීම සඳහා අනන්‍යතා සහ සංචාරක ලේඛනවල ආරක්ෂක අංග පිළිබඳ ඇති පුළුල් අවබෝධය.<br>VII. අයදුම් පත්‍රයේ අභිප්‍රාය තීරණය කිරීම සඳහා විවිධ මූලාශ්‍ර හරහා තොරතුරු වලංගු කිරීම මගින් ඒවායේ විශ්වසනීයත්වය තහවුරු කිරීමට ඇති හැකියාව.<br>VIII. විමර්ශනයට සහාය වීම සඳහා වාචික සහ වාචික නොවන ඉඟි විවේචනාත්මකව විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව.<br>IX. සාමාන්‍යයෙන් විකෘති කරන ලද හෝ වංචනික ලෙස නිර්මාණය කරන ලද අනන්‍යතා /විදේශ ගමන් බලපත්‍ර ලේඛනවල අංග නිවැරදිව හඳුනා ගැනීමට ඇති හැකියාව.<br>X. අනන්‍යතා / විදේශ ගමන් බලපත්‍ර ලේඛන සත්‍යාපනය කිරීම සඳහා තාක්ෂණික සම්පත් ඵලදායීව සහ කාර්යක්ෂමව භාවිතා කිරීම. | | |

5. තනතුරට අදාළ වැටුප් ක්‍රමය:
   රා.ප.ච. 10/2025ට අනුව MN 7 -2025, රු.71,240 – 11 X 1,360- 18 X 1,850 – 119,500/-
   ආරම්භක වැටුප පියවර - පියවර 06 - රු.78,040/-

6. පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරු සංඛ්‍යාව 69කි.
   a. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ.
   b. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදීම මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ද සිදු කරනු ඇත.
   c. සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

7. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 (II) ප්‍රකාරව එකී සම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණක් සීමා වූ අමතර කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණයක් මගින් තනතුරු සඳහා තෝරා ගැනීම සිදු කරනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන්

සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණයන් උපයෝගී කර ගනු ලැබේ. අදාළ අයදුම්කරුවන්ට මෙම ඇගයීමේ නිර්ණායක හා ලකුණු පරිමාණයන් පිළිබඳව එම අවස්ථාවේදී දැනුවත් කිරීමක් සිදු කරනු ලැබේ.

8. මෙම උසස්වීම ක්‍රියාත්මක වන දිනය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය වේ.

9.

I. සේවා කොන්දේසි:

a. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධාන වලටද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලටද, 2013.12.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන්ට හා කොන්දේසි වලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධන වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරට පත් කෙරෙනු ඇත.

b. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II. වෙනත් කොන්දේසි

a. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන්ම ගුවන් තොටුපළ හා වරායවල ද ස්වකීය රාජකාරි ඉටු කිරීම සඳහා බැඳී සිටිය යුතුය.

b. අදාළ තනතුරට බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවයන් ද සියලු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

c. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

d. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

10. අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමය:

මේ සමඟ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2026.07.22 දිනය හෝ ඊට පෙර ආගමන හා විගමන පාලක (පාලන) වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි;

ඩී.ඩබ්ලිව්.ආර්.බී. සෙනෙවිරත්න
ලේකම්
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

(නියෝජ්‍ය පාලක (තොටුපළ) මඟින් ඉදිරිපත් කළ යුතුය)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
..........................................................................................................................
(උදා : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම : ..........................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

02. ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. ජාතික හැඳුනුම්පත් අංකය

04. ජංගම දුරකථන අංකය

05. උපන් දිනය : ........................

06. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස

අවුරුදු  මාස  දින

07. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :
..........................................................................................................................

08. බලයලත් නිලධාරියෙකු වශයෙන් සේවයට බැඳුනු දිනය: ......................................................

I. තාවකාලික / සහකාර තනතුර : ..........................................................
II. ස්ථිර තනතුරට පත් වූ දිනය : ..........................................................
III. අයදුම්පත් කැඳවන අවසාන දිනට ස්ථිර සේවා කාලය : ..........................................................
IV. බලයලත් නිලධාරී I ශ්‍රේණියේ සේවා කාලය : වසර ....................
V. බලයලත් නිලධාරී II ශ්‍රේණියේ සේවා කාලය : වසර ....................
VI. සක්‍රිය සේවා කාලය : වසර ....................

(වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේද හැර වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම සේවයේ යෙදී සිටි සේවා කාලය)

09. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ දිනය : ....................................

10. බලයලත් නිලධාරී I ශ්‍රේණියට උසස් වීමෙන් පසු, I ශ්‍රේණියේ වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන තිබේද?
.....................

11. වැටුප් වර්ධක උපයා ගැනීම පිළිබඳ තොරතුරු

| වැටුප් වර්ධක දිනය | වැටුප් වර්ධකය උපයාගෙන ඇති / නැති බව |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

12. කාර්ය සාධන ඇගයුම් මට්ටම්

| වර්ෂය | ඇගයුම් මට්ටම (අසතුටුදායක බව, සතුටුදායක බව, සාමන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ බව, විශිෂ්ඨ බව) |
|---|---|
| | |
| | |
| | |
| | |

13. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 05ක කාලය තුල අවවාද කිරීම් හැර වෙනත් විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද ? ...................................

(රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රේල්ඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය)

14. වෙනත් ....................................................

15. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.

.................................................................

දිනය : ...............................

අයදුම්කරුගේ අත්සන

16. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.

ලේකම්,

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

........................................................ මයා/ මිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු පෞද්ගලික ලිපි ගොනුවෙහි ඇති තොරතුරු අනුව නිවැරදිය/ වැරදිය. ඔහුට/ ඇයට විරුද්ධව විනය ක්‍රියාමාර්ග කිසිවක් නොමැති / ගෙන ඇති බවත්, එවැනි ක්‍රියාමාර්ග ඉදිරියේදී ගැනීමට අදහස් කර නොමැති/ ඇති බවත්, අයදුම්පත් කැඳවන අවසාන දිනට බලයලත් නිලධාරී I ශ්‍රේණියේ පූර්වාසන්න වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්, කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ/ ඇයගේ අයදුම්පත නිර්දේශ කරමි/ නොකරමි.

දිනය : .......................

.....................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

තනතුරු නාමය හා නිල මුද්‍රාව

17. අමාත්‍යාංශ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතු ය.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

බලයලත් නිලධාරි I ශ්‍රේණියේ ............................................................ මයා / මියගේ රාජකාරි හා හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමඟ එකඟ වෙමි / එකඟ නොවෙමි.

දිනය : .............................

.............................................
ලේකම්,
......................................... අමාත්‍යාංශය
නිල මුද්‍රාව